රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය

රාජකීය විද්‍යාලය- කොළඹ 07
Royal College – Colombo 07

ආර්ථික විද්‍යාව I
Economics I
21- S - I

අවසාන වාර පරීක්ෂණය -2025 සැප්තැම්බර්
13 වන ශ්‍රේණිය

පැය 02

උපදෙස්:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2),(3),(4),(5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ පිටු පස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.

1. ආර්ථිකයක සමස්ථ නිෂ්පාදනය, මිල මට්ටම, ගෙවුම් ශේෂය සහ මුදල් සැපයුම වැනි විචල්‍යයන්ගේ හැසිරීම අධ්‍යයනය කිරීම
   1) සූක්ෂම ආර්ථික විද්‍යාව
   2) අභිමතානුරූපී ආර්ථික විද්‍යාව
   3) සාර්ව ආර්ථික විද්‍යාව
   4) යථානුරූපී ආර්ථික විද්‍යාව
   5) සමාජ ආර්ථික විද්‍යාව

2. නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමය යන්නෙන් වඩාත් නිවැරදිව පැහැදිලි වන්නේ,
   1) කායික වෙහෙස දරන්නේ නම් පමණි.
   2) ඵලදායී නිෂ්පාදන කාර්යයකට කාර්යක්ෂමව ශ්‍රමය වැය වේ නම් පමණි.
   3) වැටුප් ආදායමක් උපයන්නේ නම් පමණි.
   4) ස්ථිර රැකියාවක නිරත වේ නම් පමණි.
   5) මානසික ශක්තිය කැප කිරීමට සිදු වේ නම් හා ඊට ගෙවීමක් කරන්නේ නම් පමණි.

3. කල්පිත ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති මට්ටමේ සිටින විට එක් භාණ්ඩයක නිමවුම ඒකක මිලියන 9 සිට මිලියන 10 දක්වා වැඩි කිරීමට යාමේ දී තවත් භාණ්ඩයක නිමවුම මිලියන 16 සිට මිලියන 13 දක්වා අඩු කිරීමට සිදු වුයේ නම් නම් ගත හැකි නිගමනය වන්නේ,
   1) සම්පත් බෙදී යාම කාර්යක්ෂම වේ.
   2) නිෂ්පාදනයේ අකාර්යක්ෂමතා පවතී.
   3) ආර්ථික කාර්යක්ෂමතාව අත්කරගෙන ඇත.
   4) ඉහළ යන ආවස්ථික පිරිවැයට මුහුණ දී සිටී.
   5) නිෂ්පාදන කාර්යක්ෂමතාව අත්කර ගෙන ඇත.

4. මිශ්‍ර ආර්ථිකයක් සම්බන්ධව එකඟ නොවිය හැකි ප්‍රකාශය කුමක්ද?
   1) රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයට ම දේපළ අයිතියක් පැවතීම
   2) මිල ක්‍රමය හා සැලසුම් ක්‍රමය යන යාන්ත්‍රණයන් දෙකෙහි ම ක්‍රියාකාරිත්වය
   3) සම්පත් බෙදී යාමේ අසමානතා නොපැවතීම
   4) පෞද්ගලික අංශයට මිලෙන් සානුබල ලැබීම
   5) රජය පෞද්ගලික අංශයෙන් බදු අය කිරීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

5 . දැව ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින වඩු කාර්මිකයකු රජයේ දැව ගබඩාවෙන් රු. 500 000 ක් වටිනා දැව තොගයක් මිලට ගනී. එය ආර්ථික විද්‍යාත්මකව හැදින් වූ විට,

1) සාමාන්‍ය ඉල්ලුමකි..
2) සෘජු ඉල්ලුමකි.
3) වෙළෙඳපොළ ඉල්ලුමකි.
4) වක්‍ර ඉල්ලුමකි.
5) පූර්ණ ඉල්ලුමකි

6. පහළට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක් සහිත භාණ්ඩයක හුවමාරුවට සම්බන්ධ වන පාර්ශවකරුවන්ගේ ආර්ථික අතිරික්තය උපරිම වන විට මිල ඉල්ලුම් නම්‍යතාව

1) අපරිමිත වේ.
2) එකට වඩා අඩු විය යුතුය.
3) ශූන්‍ය වේ.
4) එකට වඩා අඩු විය යුතුය
5) එක විය යුතුය.

7.




රූපසටහනේ දැක්වෙන ආකාරයට මිල $OP_1$ යටතේ $OQ_1$ වෙළඳපොළ සමතුලිතය වේ. මෙම භාණ්ඩය නොමිලේ සැපයීමට තීරණය කලහොත්,

1) පාරිභෝගික අතිරික්තය AB සිට A + B + C දක්වා වැඩි වේ.
2) පාරිභෝගික අතිරික්තය A + B ප්‍රමාණයෙන් වැඩි වේ.
3) පාරිභෝගික අතිරික්තය A සිට A + B දක්වා වැඩි වේ.
4) පාරිභෝගික අතිරික්තය A සිට A + B + C දක්වා වැඩි වේ.
5) පාරිභෝගික අතිරික්තය B + C ප්‍රමාණයෙන් වැඩි වේ.

8. එක්තරා භාණ්ඩයක වෙනුවෙන් පාරිභෝගිකයා දරන වියදම රු. 800 ක් වනුයේ, මිල රු 10 ක් වන විට ය. එම භාණ්ඩයට මිල රු. 12 ක් වන විට පාරිභෝගික පැහැදම රු. 1 080 ක් වේ. මෙම භාණ්ඩය සම්බන්ධයෙන් එළැඹිය හැකි නිවැරදි නිගමනය වන්නේ,

1) වෙළඳපොළෙ සමීප ආදේශක බහුල වීම.
2) පාරිභෝගිකයා සිය ආදායමෙන් විශාල ප්‍රතිශතයක් වැය කරන භාණ්ඩයකි.
3) වෙළඳපොළෙ කිට්ටු ආදේශක නොමැත.
4) බහුවිධ අරමුණු නොමැති භාණ්ඩයකි.
5) නිගමනයට එළඹීමට කරම දී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවේ.

9. එක්තරා නගරයක මාළු පාරිභෝගිකයන් කණ්ඩායම් තුනක් සම්බන්ධයෙන් කළ පරිභෝජන සමීක්ෂණයක තොරතුරු පහත දැක්වේ.

| පාරිභෝගික කණ්ඩායම | මිල වැඩි වීම | ඉල්ලුම අඩු වීම | ආදායම් ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|---|
| X | 10% | 16% | 0.6 |
| Y | 10% | 11% | -2.5 |
| Z | 10% | 7% | -1.2 |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

එකහ විය හැකි ප්‍රකාශය කුමක්ද
1) X කණ්ඩායමට මාළු සාමාන්‍ය භාණ්ඩයකි.
2) X කණ්ඩායමට මිල ඉල්ලුම නම්‍ය වුවද ආදායමට අනුව සුඛෝපභෝගී භාණ්ඩයකි.
3) Y කණ්ඩායමේ ඉල්ලුම අනම්‍ය වන අතර ආදායමට සාපේක්ෂව බාල භාණ්ඩයකි.
4) Z කණ්ඩායමට මිල අනම්‍ය වුව ද ආදායමට අනුව සාමාන්‍ය භාණ්ඩයකි.
5) Y සහ Z කණ්ඩායම් දෙකෙහි ඉල්ලුම් මිල අනම්‍ය වන අතර ආදායමට සාපේක්ෂව සුඛෝපභෝගී භාණ්ඩයකි.

10. සැපයුම් රේඛාව $Q_s = -40 + 3P$ ගන්නා භාණ්ඩයක් මත රු. 5 ක ඒකක සහනාධාරයක් ලබා දුන් විට සැපයුම් වක්‍රය

1) $Q_s = -55 + 3P$
2) $Q_s = -25 + 3P$
3) $Q_s = -40 + 15P$
4) $Q_s = 40 - 15P$
5) $Q_s = 55 + 3P$

11. ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන පාරිභෝගික ආදායම ඇතුළු අනෙකුත් කරුණු ස්ථාවරව තිබියදී මූර්ත ආදායම ඉහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය ද ඉහළ යාමට නම්.

1) සලකා බලන භාණ්ඩය ගිෆන් භාණ්ඩයක් විය යුතුයි.
2) සලකා බලන භාණ්ඩයේ මිල ඉහළ යා යුතුයි.
3) සලකා බලන භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් විය යුතුයි.
4) සාපේක්ෂ මිලෙහි ඉහළ යාමක් සිදුවිය යුතුයි.
5) භාණ්ඩයේ ඉල්ලුම සාපේක්ෂව නම්‍ය විය යුතුයි.

12. **Qd = -10P + 200** වන වෙළඳපළ ඉල්ලුම් වක්‍රයක් සහිත භාණ්ඩයක මිල රු.15.00 දී

| | ඉල්ලුම් නම්‍යතාව | පාරිභෝගික අතිරික්තය |
|---|---|---|
| 1) | -1.0 | 50 |
| 2) | -3.0 | 125 |
| 3) | -2.0 | 150 |
| 4) | -2.5 | 120 |
| 5) | -1.5 | 50 |

13. රජය යම් භාණ්ඩයක් සඳහා වෙළඳපොළෙ දී සහතික මිල ක්‍රියාවට නැංවීමට අතිරික්ත සැපයුම මිලදී ගැනීම වෙනුවට ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය යොදා ගනු ලැබුවහොත්,

1) පාරිභෝගික අතිරික්තය අඩුවේ
2) නිෂ්පාදන අතිරික්තය වෙනස් වේ
3) රජයේ සහනාධාර පිරිවැය සමාන වේ
4) සමාජ සුභසාධනය වෙනසක් සිදු නොවේ
5) නිෂ්පාදන අතිරික්තය වෙනසක් නොවේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

14. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක ක්‍රියාත්මක වන ආයතනයක් පහත රූපසටහනින් පෙන්වා ඇත.




මෙම ආයතනයෙහි ලාභ උපරිම වන නිමැවුම් මට්ටම හා අලාභ උපරිම වන නිමැවුම් මට්ටම වන්නේ,

| | ලාභ උපරිම වන නිමවුම් මට්ටම | අලාභ අවම වන නිමවුම් මට්ටම |
|---|---|---|
| 1) | $Q_5$ | $Q_1$ |
| 2) | $Q_3$ | $Q_1$ |
| 3) | $Q_4$ | $Q_2$ |
| 4) | $Q_3$ | $Q_2$ |
| 5) | $Q_2$ | $Q_4$ |

15. පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක කෙටි කාලයේදී සමතුලිතයට පත් වන නිමවුම් මට්ටමේ දී නිෂ්පාදන අතිරික්තයකට හිමිකම් කියනු ලබන්නේ,

1) ආර්ථික ලාභ ලබන්නේ නම් පමණි.
2) භාණ්ඩයේ මිල ආන්තික පිරිවැයට සමාන වන විට දී ය.
3) ආර්ථික ලාභ හෝ අලාභ ලබන ඕනෑම අවස්ථාවක දී ය.
4) ආර්ථික ලාභ ලබන විට හා මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන තත්ත්වයක දී අලාභ ලබන විටදී ය.
5) ආර්ථික ලාභ ලබන විට හා මිල සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි තත්ත්වයක දී අලාභ ලබන විටදී ය.

16. නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේදී පළමු වන ඒකකය නිපදවීම සඳහා රු. 500 ක මුළු පිරිවැයක් දැරිය යුතුය. එහිදී දැරිය යුතු ආන්තික පිරිවැය රු. 150 ක් නම්, එම ඒකකය නිපදවීමේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය කොපමණ ද?

1) රු. 350  2) රු. 650  3) රු. 250  4) රු. 150  5) රු. 500

17. නිෂ්පාදන ආයතනයකට වෙළඳපොළ තුළ **ස්වාභාවික ඒකාධිකාරයක්** බිහිකර ගැනීමට අවශ්‍යයෙන් ම බලපාන සාධකය වන්නේ,

1) අදාල භාණ්ඩය නිපදවීමේ බලපත්‍රය එම ආයතනය සතුව පමණක් තිබීම.
2) නිෂ්පාදනය ප්‍රසාරණයේ දී පරිමාණානුකූල පිරිමැසුම් අත් කර ගත හැකි වීම.
3) වෙළඳපොළ තුළ එක් ආයතනයක් පමණක් නිෂ්පාදනයේ නියැලී සිටීම.
4) වෙළඳපොළ ට ඇතුලත් වීමට ඇති දැඩි බාධා.
5) නිපදවන භාණ්ඩය සඳහා සමීප ආදේශක නොතිබීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

18. ආර්ථික බදු කුලිය යනු,
1) රජයේ සේවාවන් ප්‍රයෝජනයට ගැනීම උදෙසා රජයට කළ යුතු ගෙවීමකි.
2) ඕනෑම නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තබා ගැනීමට කරනු ලබන අවම ගෙවීමකි.
3) නම්‍ය සැපයුමක් ඇති ඕනෑම නිෂ්පාදන සාධකයකට එහි මුළු පිරිවැය ඉක්මවා ලැබෙන අතිරික්තයකි.
4) අනම්‍ය සැපයුම් තත්ත්වයක් ඇති ඕනෑම සාධකයකට එහි ආවස්ථික පිරිවැය ඉක්මවා ලැබෙන අතිරික්තයයි.
5) සම්පත්වල ආවස්ථික පිරිවැය වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදලකි.

19. ජාතික ගිණුම් යටතේ දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය (Gross fixed capital for mation ) ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අතරින් කවරක් ඇතුලත් කරයි ද?
1) අක්කර 5ක පොල් වගාවක්
2) නව මෝටර් රථයක් මිලදී ගැනීම
3) දැව ලබා ගැනීමට වවන ගස්
4) වටිනා මුතු මැණික් ආභරණ මිලදී ගැනීමට කරනු ලබන වියදම්
5) නිෂ්පාදන සමාගමක කොටස් 10 000 ක් මිලදී ගැනීම.

20. කිසියම් ආර්ථිකයකට අදාල ජාතික ගිණුම් දත්ත කිහිපයක් පහත දැක් වේ.

| අයිතම | වටිනාකම (රු.මි.) |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | 900 |
| ගෙවුම් තුලන ලේඛනයේ ද්විතිය ආදායම් ගිණුම් ශේෂය | - 80 |
| ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රාථමික ආදායම් ගිණුම | - 50 |
| දළ දේශීය වියදම | 1 000 |

ඉහත ආර්ථිකයේ දළ ජාතික ආදායම හා ශුද්ධ අපනයන වල වටිනාකම පිළිවෙලින්

| | දළ ජාතික ආදායම | ශුද්ධ අපනයන |
|---|---|---|
| 1) | 950 | 920 |
| 2) | 1050 | 100 |
| 3) | 850 | 1 900 |
| 4) | 850 | - 100 |
| 5) | 720 | - 100 |

21. රජයක් සහිත ආර්ථිකයකට අදාලව පහත දත්ත ඔබට සපයා දී ඇත.

ගිලිහීම් ශ්‍රිතය (w) $= -100 + 0.25y$
සමතුලිත ආදායම (Y) $= 5\,400$
වැයකළ හැකි ආදායම (Yd) $= 5\,000$

මෙම ආර්ථිකයෙ පරිභෝජන ශ්‍රිතය වන්නේ
1) $C = 100 + 0.75\ Yd$
2) $C = 500 + 0.75\ Yd$
3) $C = 300 + 0.75Yd$
4) $C = 400 + 0.75\ Yd$
5) $C = 0.75\ Yd$

22. පහත සඳහන් කවර කරුණක් ගුණකයේ වටිනාකම අඩු කිරිමට තුඩු දේ ද?
1) ආණ්ඩුවේ ආයෝජන නැම්යාව වැඩි වීම
2) ආන්තික පරිභෝජන නැම්යාව වැඩි වීම
3) ආන්තික ඉතුරුම් නැම්යාව වැඩි වීම
4) පරිභෝජන වියදම වැඩි වීම
5) අපනයන පරිමාව ඉහළ යාම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

23. දළ දේශීය නිෂ්පාදිතයේ විශාල අඩු වීමකට බලපානුයේ පහත සඳහන් කවරක් ද?
1) ආණ්ඩුවේ මිලදී ගැනීම් හා බදු අයකිරීම් යන දෙකම රු.මි.50 කින් ඉහළ යාම.
2) ආණ්ඩුවේ මිලදී ගැනීම් හා බදු අය කිරීම් යන දෙවර්ගයම රු.මි. 50 කින් අඩු වීම.
3) රු.මි. 50 කින් බදු වැඩි කළ විට.
4) රු. මි. 50 කින් ආණ්ඩුවේ මිලදී ගැනීම් අඩු වීම.
5) රු. මි. 50 කින් ශුද්ධ අපනයන ඉහළ යාම.

24. කාලගුණික හා දේශගුණික විපර්යාස හේතුවෙන් නිෂ්පාදන අංශයේ දිගින් දිගට ම බිඳ වැටීමක් සිදු වන වාතාවරණයක් තුළ වඩාත් නිවැරදි වන්නේ, කවර පුරෝකථනයක් ද?
1) විවිධත්වය හේතුවෙන් සන්තුෂ්ටිය ඉහළ යයි.
2) සැපයුම් පාර්ශවීය උද්ධමනයක් බිහි වේ.
3) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයක් බිහිවේ.
4) මිල ස්ථායිකරණයට වාසිදායක බලපෑම් ඇති වේ.
5) ආර්ථික වර්ධන වේගයට යහපත් බලපෑමක් ඇති කරයි.

25. මහ බැංකුව විසින් වාණිජ බැංකු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 15% සිට 7.5% දක්වා වෙනස් කලේ නම් එම වෙනස ආර්ථිකයේ මුදල් සැපයුමට ඇති කරන බලපෑම කෙසේ ද?
1) මුදල් සැපයුම නොවෙනස්ව පවතී.
2) මුදල් සැපයුම සංකෝචනයට හේතු වේ.
3) මුදල් සැපයුම ප්‍රසාරණයට හේතු වේ.
4) මුදල් සැපයුම ප්‍රසාරණයක් මෙන්ම සංකෝචනයක් ද සිදු වේ.
5) මුදල් සැපයුම වෙනස් වන ආකාරය අවිනිශ්චිත වේ.

26. '2024 වර්ෂයේදි ශ්‍රී ලංකාවේ පුළුල් මුදල් සැපයුම ($M_4$) රු.ට්‍රි. 173 කට ආසන්න ප්‍රමාණයකින් වැඩි විය' මෙම වැඩි වීමට දායක වූ ප්‍රධාන සාධකය කුමක් ද?
1) ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාම
2) රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ යාම
3) පෞද්ගලික අංශයට දෙන ණය ප්‍රමාණය ඉහළ යාම
4) රාජ්‍ය සංස්ථාවලට දෙන ණය ප්‍රමාණය ඉහළ යාම
5) මහජනයා සතු ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය ඉහළ යාම.

27. ශ්‍රී ලංකා තුළ මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusion) ප්‍රවර්ධනය කිරීම යනු කුමක් ද?
1) බදු අනුපාතිකයන් අඩු කිරීම හා ණය පහසුකම් සැපයීමයි
2) සියලුම පුද්ගලයින්ට සහ ව්‍යාපාර සඳහා මූල්‍ය සේවා ලබා දීමේ හැකියාව වැඩි කිරීමයි
3) විදේශ බැංකු තහනම් කිරීමයි
4) රජයේ වියදම් අඩු කිරීමයි
5) මුදල් මුද්‍රණය කිරීම විශාල කිරීමයි.

28. එක් දින පොලී අනුපාතිකය (Overnight Policy Rate) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
1) බැංකු අතර දිනකින් අඩු කාලයකට කරන ණය සඳහා මහ බැංකුව විසින් නියම කර ඇති පොලී අනුපාතිකයයි
2) රාජ්‍ය සේවකයින්ට ගෙවෙන වැටුප් ප්‍රතිශතයයි
3) ව්‍යාපාර සඳහා නියමිත උපරිම පොලී අනුපාතිකයයි
4) විදේශීය ණය සඳහා ගෙවිය යුතු බැංකු අතර එක් දින පොලී අනුපාතිකයයි
5) විදේශ විනිමය ගනුදෙනු සඳහා යොදාගන්නා අනුපාතිකයයි


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

29. කල්පිත ආර්ථිකයක බැංකු පද්ධතියක් තුළ කටයුතු කරන එක බැංකුවකට අදාල තොරතුරු පහත දැක්වේ. සංචිත අනුපාතිකය 25% වේ නම් මෙම බැංකුවට තව කොතරම් ණය සැපයිය හැකි ද?

| වගකීම් | වටිනාකම(රු.මි.) | වත්කම් | වටිනාකම(රු.මි.) |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු<br>ප්‍රාග්ධනය | 6 000<br>1 500 | සංචිත<br>සුරකුම් පත්<br>ණය | 2 250<br>1 000<br>4 250 |
| මුළු වගකීම් | 7 500 | මුළු වත්කම් | 7 500 |

1) 3 750 2) 2 750 3) 2 250 4) 750 5) 1 000

30. කියවීමේ රුචිය සහිත බොහෝ පිරිසක් පුස්තකාලය සමඟ සමීප ව කටයුතු කරයි. ආර්ථික විද්‍යාවට අනුව **'පුස්තකාලය'** පිළිබඳ වඩාත් ම නිවැරදි ඉදිරිපත් කිරීම වන්නේ,
1) පෞද්ගලික භාණ්ඩයකි.
2) සුභසාධන භාණ්ඩයක් මෙන් ම පොදු භාණ්ඩයක් ද වේ.
3) සුභසාධන භාණ්ඩයක් මෙන් ම අර්ධ පොදු භාණ්ඩයක් ද වේ.
4) සුභසාධන භාණ්ඩයක් පමණි.
5) අර්ධ පොදු භාණ්ඩයක් පමණි.

31. සමාජීය වශයෙන් වාසිදායක බැවින් එක්තරා පෞද්ගලික ව්‍යාපෘතියක් අනුමත කිරීමට රජය තීරණය කරන ලදී. මෙම තීරණයට එළඹීමේ දී ව්‍යාපෘතියේ පෞද්ගලික පිරිවැය රු.මි. 700 ක් ද, පෞද්ගලික ප්‍රතිලාභ රු.මි. 800 ක් ද බාහිර පිරිවැය රු.මි. 200 ක් ද ලෙස ඇස්තමේන්තු කරන ලදී.
මෙම දත්තවලට අනුව ව්‍යාපෘතියේ බාහිර ප්‍රතිලාභ පිළිබඳව නිවැරදි නිගමනය වනුයේ කවරක් ද?
1) බාහිර ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභවලට සමාන වේ.
2) බාහිර ප්‍රතිලාභ බාහිර පිරිවැය ඉක්මවා යනු ඇත.
3) බාහිර ප්‍රතිලාභ ධන අගයක් ගන්නා නමුදු රු. මි. 100 කට අඩු ය.
4) බාහිර ප්‍රතිලාභ රු.මි. 100 ඉක්මවා යයි.
5) බාහිර ප්‍රතිලාභ කිසිවක් නොමැත.

32. කුලී ගෙවීම් හැසිරීම (Rent – Seeking Believer) යනු ආණ්ඩුවක් අසමත් වීමට බලපාන එක් සාධකයකි. එයින් අදහස් වන්නේ
1) බදු පැහැර හැරීම යනුවෙන් අයවැය ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් ඇති වීමයි.
2) කුටුම්භ සංක්‍රාම ඉහළ නැංවීම මඟින් බිහි වන අලස බව පිළිබඳ සමාජ ගැටලුවකි.
3) ආර්ථික වශයෙන් කාර්යක්ෂම අංශ වෙනුවට ඵලදායිතාව අඩු කර්මාන්ත වෙත දේශපාලනික සම්බන්ධතා මත සම්පත් යොමු වීමේ ගැටලුවකි.
4) ධන බාහිරතා ඇති කර්මාන්ත පමණක් තෝරා ගැනීමේ ගැටලුවකි.
5) දේශීය සම්පත් මඟින් විදේශීය ආයෝජකයන්ගේ ඉපයීම ඉහළ යාම මත ප්‍රාථමික ශේෂය හිඟ වීමේ ගැටලුවකි.

33. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ (public financial consolidation) ප්‍රධාන අරමුණු මොනවා ද?
1) රාජ්‍ය වියදම් අතිරික්ත කිරීම සහ බදු අඩු කිරීම
2) රාජ්‍ය ආදායම් ඉහළ දැමීම සහ වියදම් පාලනය කිරීම
3) ව්‍යාපාරික මූල්‍ය වාර්තා ගොනු කිරීම
4) විදේශ ණය පමණක් ගෙවීම
5) මූල්‍ය පද්ධතිය ජාතිකවම පෞද්ගලික පාලනයකට දීම.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

34. ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා සෘජුවම ඉලක්ක කර ඇති පියවර කුමක් ද?
1) පවතින කෝටා අඩු කිරීම
2) පොලී අනුපාත වැඩි කිරීම
3) අපනයන කර්මාන්ත සඳහා සහනාධාර ගෙවීම
4) අවපාත කාලවලදී වැටුප් සහනාධාර යෝජනා ක්‍රම
5) රට තුළ බදු අනුපාත වැඩි කිරීම

35. රටක් භාණ්ඩ හා සේවා අපනයන වටිනාකම පහත වැටීමක් සහ ආනයන වටිනාකම වැඩි වීමක් අත් විඳිමින් සිටි නම්,මෙම වෙනස්කම්වල බලපෑම් මොනවා ද?

| | සමස්ත ඉල්ලුම | භාණ්ඩ හා සේවා මත ගෙවුම් ශේෂය |
|---|---|---|
| 1) | පහළ වැටේ. | දියුණු වේ. |
| 2) | පහළ වැටේ. | නරක අතට හැරේ |
| 3) | වැඩි වේ. | දියුණු වේ. |
| 4) | වැඩි වේ | නරක අතට හැරේ. |
| 4) | නොවෙනස්ව පවතී. | දියුණු වේ. |

36. රජයක සාර්ව ආර්ථික අරමුණක් වන්නේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයේ සිට අතිරික්තයක් දක්වා ගෙන යාමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා එය මුදල් අවප්‍රමාණය කරයි. මුදල් අවප්‍රමාණය මගින් මෙම අරමුණ සාක්ෂාත් කර ගනු ලබන්නේ කුමන කොන්දේසියක් යටතේ ද?

1) අපනයන හා ආනයන සඳහා ඒකාබද්ධ මිල ඉල්ලුම් නම්‍යතාවය 1 ට වඩා වැඩි නම්
2) අපනයන හා ආනයන සඳහා ඒකාබද්ධ මිල ඉල්ලුම් නම්‍යතාවය 1 ට වඩා අඩු නම්
3) ආදායම් ඉල්ලුම් නම්‍යතාවය 1ට වඩා අඩු නම්
4) අනෙකුත් රටවල් සියළුම ආනයනික භාණ්ඩ හා සේවා මත තීරු බදු පැනවමට තීරණය කළහොත්
5) ආනයන සැපයුම් මිල නම්‍යතාවය 1 ට වඩා අඩු නම්

37. කිසියම් රටක් විසින් තමන්ගේ රටට ආනයනය කරන භාණ්ඩ මත ආනයන සලාක නියම කිරීමෙන් අපේක්ෂා කරන්නේ,

1) වෙළෙඳ බාධක පැනවීම වලක්වා ගැනීම.
2) දේශියව නිෂ්පාදිත භාණ්ඩ සඳහා හොඳ වෙළඳපොළක් ලබා දීම.
3) භාණ්ඩ නිෂ්පාදන පිරිවැය අඩුකොට ආනයන ධෛර්යමත් කිරීම.
4) දේශිය වෙළඳපොළ තුළ භාණ්ඩ මිල පහත හෙලීම.
5) දේශිය භාණ්ඩ නිෂ්පාදනවල නිෂ්පාදන පිරිවැය අඩු කිරීම.

38. සලකා බලන එක් රටකට සලකා බලන වෙනත් රටකට වඩා අඩු සම්පත් භාවිතයකින් මෙන් ම අඩු කාලයකින් යම් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි නම් එරටට එම භාණ්ඩය සම්බන්ධයෙන් ,

1) කාර්යක්ෂමතාවයක් තිබේ.
2) විශේෂීකරණයේ අවාසියක් තිබේ.
3) රජයට පහසුවෙන් බදු පැනවීමේ අවස්ථාවක් තිබේ.
4) සාපේක්ෂවාසියක් තිබේ.
5) නිරපේක්ෂවාසියක් තිබේ.

39. මෑත කාලයේ ගෙවුම්ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ සේවා ආදායම් ගිණුම ධන අගයක් ගෙන ඇත. ඒ සඳහා වැඩිම දායකත්වය සංචාරක ඉපයීම් වර්ධනය වීම මගිනි, ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයන් පැමිණි රටවල් වනුයේ

1) ඉන්දියාව,චීනය, රුසියාව
2) රුසියාව, චීනය, යුක්රේනය
3) ඊශ්‍රාලය, යුක්රේනය, චීනය
4). ඉන්දියාව, රුසියාව, එංගලන්තය
5) චීනය , යුක්රේනය, එංගලන්තය


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

40. වෙළෙඳාමට පාත්‍ර වන සමාන භාණ්ඩ පැසක වටිනාකම රටවල් දෙකේ දේශීය මුදල් ඒකක වලින් මනිනු ලැබුවහොත් එම අගයන් දෙක අතර අනුපාතය හඳුන්වනුයේ, පහත කවරක් ලෙස ද?

1) සඵල ආරක්ෂණය ලෙස ය.
2) මූර්ත විනිමය අනුපාතය ලෙස ය.
3) මූර්ත සඵල විනිමය අනුපාත ලෙස ය.
4) ස්ථාවර විනිමය අනුපාතය ලෙස ය.
5) ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය ලෙස ය.

41. අපනයන වෙළෙඳාමේදී ශ්‍රී ලංකාවට වැඩිම වැදගත්කමක් ලබා දෙන අපනයන කාණ්ඩය හා භාණ්ඩ වර්ගය වන්නේ

1) කෘෂි අපනයන හා තේ නිෂ්පාදනයයි.
2) කාර්මික අපනයන හා රබර් නිෂ්පාදනයයි.
3) කෘෂි අපනයන හා පොල් නිෂ්පාදනයයි.
4) කාර්මික අපනයන හා ඛනිජ තෙල් නිෂ්පාදනයයි.
5) කාර්මික අපනයන හා රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදනයයි.

42. ශ්‍රී ලංකාව ඉහළ තරඟකාරිත්වයක් සහිත අපනයනාභිමුඛ ඩිජිටල් ආර්ථිකයක් බවට පත් කිරීම මූලික අරමුණ කරගෙන 2024 වර්ෂය තුළ පාර්ලිමේන්තුව තුළින් සම්මත කර ගත් පණත කවරේ ද?

1) ගෝලීය තරඟකාරිත්ව පණත
2) ආර්ථික පරිවර්තන පණත
3) රාජ්‍ය මූල්‍ය කළමණාකරන පණත
4) 2023 වර්ෂයේදී සංශෝධනය කළ ශ්‍රී ලංකා මහ බැංකු පණත
5) 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පණත.

43. ආර්ථික වෘර්ධියේ රෝද හතරකි. එයට අයත් නොවන අයිතමය වන්නේ,

1) ප්‍රාග්ධනය
2) මානව ප්‍රාග්ධනය
3) මිල මට්ටම
4) ස්වාභාවික සම්පත්
5) තාක්ෂණික දියුණුව හා නවෝත්පාදනය

44. කිසියම් කල්පිත ආර්ථිකයකට අදාලව වැඩකළ හැකි වයසේ පසුවන ජන සංඛ්‍යාව මිලියන 40 කි. ආර්ථික වශයෙන් සක්‍රිය ජන සංඛ්‍යාව මිලියන 20 කි. සේවා නියුක්ති ජන සංඛ්‍යාව මිලියන 15 කි. මෙම දත්ත වලට අනුව සේවා වියුක්ති අනුපාතිකය හා ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය වන්නේ,

| | සේවා වියුක්ති අනුපාතිකය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික |
|---|---|---|
| 1) | 20% | 50% |
| 2) | 25% | 50% |
| 3) | 25% | 40% |
| 4) | 50% | 25% |
| 50 | 60% | 40% |

45. සමෘර්ධි වැඩසටහනේ අනුප්‍රාප්තිකයකු ලෙස **"අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ වැඩසටහනෙහි"** අන්තර්ගත සමාජ කණ්ඩායමක් නොවන්නේ,

1) සංක්‍රාන්ති කණ්ඩායම
2) අවධානමට ලක් විය හැකි කණ්ඩායම
3) දුප්පත් කණ්ඩායම
4) දැඩි දුප්පත් කණ්ඩායම
5) හුදකලා (Isolate) කණ්ඩායම

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers Study Resources

46. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය,

1) ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාවට ලංවන තරමට සාපේක්ෂ ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය ඉහළ වේ.
2) ගිනි සංගුනකය 1 ට ආසන්න වන විට දිළිඳු බව පහළ යයි.
3) ගිනි සංගුණකය ශුන්‍යයට ආසන්න වන විට ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාව වඩාත් ලංව පිහිටයි.
4) ගිනි සංගුණකය ගණනය කිරීමේදී සම ආදායම් ව්‍යාප්ති රේඛාව පහළින් පිහිටි සම්පූර්ණ ත්‍රිකෝණයේ වර්ගඵලය ගණනය කරයි.
5) ලෝකයේ දියුණු රටවල ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාවෙන් ඈත්වන අතර ගිනි සංගුණකය 1 ට වඩාත් ආසන්න වේ.

47. පහත සඳහන් ආර්ථික හා සමාජ දර්ශකවල 2023 වර්ෂයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිවැරදි ශ්‍රේණිගත කිරීම් දැක්වෙන ප්‍රකාශය වන්නේ,

| | මානව සංවර්ධන දර්ශකය | ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | ලෝක සතුටු දර්ශකය |
|---|---|---|---|
| 1) | 90 ස්ථානය | 112 ස්ථානය | 137 ස්ථානය |
| 2) | 90 ස්ථානය | 72 ස්ථානය | 78 ස්ථානය |
| 3) | 78 ස්ථානය | 84 ස්ථානය | 112 ස්ථානය |
| 4) | 90 ස්ථානය | 84 ස්ථානය | 40 ස්ථානය |
| 5) | 146 ස්ථානය | 108 ස්ථානය | 78 ස්ථානය |

48. ලෝකයේ ඉහළම මානව සංවර්ධනයක් පවතින රටවල් වන්නේ,

1) ස්විස්ටර්ලන්තය, නෝර්වේ, අයිස්ලන්තය, හොංකොං හා ඩෙන්මාර්කය
2) ස්විඩනය, ස්විස්ටර්ලන්තය, පින්ලන්තය, කැනඩාව හා ඇමරිකාව
3) පින්ලන්තය, අයර්ලන්තය, නෝර්වේ, ඩෙන්මාර්කය. හා ඇමරිකාව
4) ස්විඩනය, නොර්වේ, පින්ලන්තය, හොංකොං හා අයර්ලන්තය
5) ස්විස්ටර්ලන්තය, ස්විඩනය, නෝර්වේ, පින්ලන්තය හා නවසීලන්තය

49. ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ මූලික පක්ෂණයක් නොවන්නේ,

1) පුරුෂයන්ට වඩා කාන්තාවන්ගේ සේවා වියුක්තිය ඉහළ මට්ටමක් වීම.
2) උගතුන්ට වඩා කාන්තාවන්ගේ සේවා වියුක්තිය ඉහළ මට්ටමක් වීම.
3) ග්‍රාමීය හා නාගරික අංශයට සාපේක්ෂව වතු අංශයේ ඉහළ සේවා වියුක්තියක් තිබීම.
4) සේවා වියුක්තිකයන්ගෙන් බොහෝ පිරිසක් වසරකට වඩා වැඩි කාලයක් රැකියාවක් අපේක්ෂාවෙන් සිටින පුද්ගලයකු වීම.
5) 2022 න් පසු ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය 5% කට වඩා අඩු අගයක් ගැනීම.

50. ආර්ථික පරිවර්තන පණතෙහි මූලිකම අරමුණ වඩා හොඳින් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරක් ද?

1) ශ්‍රී ලංකාව ඉහළ තරඟකාරීත්වයක් සහිත අපනයනආභිමුඛ ඩිජිටල් ආර්ථිකයක් බවට පත් කිරීමයි.
2) ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ වීම වැඩි කිරීම යි.
3) සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ ණය තිරසරභාවය සාක්ෂාත් කර ගැනීම යි.
4) සියලු දෙනා ඇතුළත් වූ ආර්ථික වර්ධනය හා සමාජ ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම යි.
5) ඍජු විදේශ ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% මට්ටමකට ගෙන ඒම යි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය - කොළඹ 07 රාජකීය විද්‍යාලය

**රාජකීය විද්‍යාලය- කොළඹ 07**
**Royal College – Colombo 07**

**ආර්ථික විද්‍යාව I I**
**Economics I I**
**21- S- I I**

**අවසාන වාර පරීක්ෂණය -2025 සැප්තැම්බර්**
**13 වන ශ්‍රේණිය**

*පැය 03 යි; 10*

උපදෙස්:

- 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන , ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ඔබට කියවීම් කාලය ලෙස විනාඩි 10 ක් ලැබේ.

**'අ' කොටස**
**( මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

1.(i). ශුන්‍ය මිලකදී සැපයෙන ඇතැම් භාණ්ඩ ආර්ථික භාණ්ඩ ලෙස හඳුන්වන්නේ ඇයි. පැහැදිලි කරන්න (ලකුණු 4)

(ii). ස්වභාවික සම්පත්යනු කවරේ ද? ඒවා වර්ග කළ හැකි ප්‍රවේශ පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii). නිෂ්පාදනය කාර්යක්ෂමතාව අත්පත් කරගත් පමණින් රටකට ආර්ථික කාර්යක්ෂමතාව අත්පත් කර ගත හැකිය. මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද, පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv). නිදහස් වෙළඳපළ ආර්ථික පද්ධතියක් විධානගත ආර්ථික පද්ධතියකින් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 4)

(v). පහත සඳහන් අවස්ථා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක නිරූපණය කරනුයේ කෙසේ ද?

(අ). යටිතල පහසුකම් පුළුල්වීම හේතු කොටගෙන භාවිතා නොවූ ග්‍රාමීය සම්පත් නිෂ්පාදනයට යොමු වීම

(ආ). ස්වභාවික ආපදාවක් හේතුවෙන් ආර්ථිකය නිෂ්පාදන සම්පත්වල අඩු වීම

(ඉ). පරිගණක කර්මාන්තයට සාපේක්ෂව ඇඟලුම් කර්මාන්තය වැඩි, වේගයකින් ප්‍රසාරණය වීය.

(ඊ). ආර්ථික පසුබෑමකට ලක්ව සිටි ආර්ථිකයක මූර්ත නිමවුමේ වර්ධනයක් (ලකුණු 1 x 4)

2. (i). ඉල්ලුම් නීතිය යනු කුමක් ද? සාමාන්‍ය භාණ්ඩයක මිල වැඩිවීමේදී ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු වන්නේ ඇයි? (ලකුණු 4)

(ii). සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවීමේ දී පාරිභෝගික පැහැදම හැසිරෙන ආකාරය විවිධ නම්‍යතා ස්වරූපවලදී වෙනස් වන්නේ කවර ආකාරයට ද? (ලකුණු 4)

(iii). ගිෆන් භාණ්ඩයක මිල අඩුවීමේ දී ඉල්ලුම් කරන ප්‍රමාණය අඩුවේ ද වැඩිවේ ද ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 6)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers Study Resources

(iv). එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ

$$Qd = 120 - 4P$$
$$Qs = -30 + 6P$$

(අ). සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න

(ආ). සමතුලිත මිලේ දී විචලා පිරිවැය ගණනය කරන්න

(ඉ). ඒකක 90 අධි සැපයුම් මිල ගණනය කරන්න (ලකුණු2x 3=6)

3. (i). සැපයුම් වක්‍රයක් විතැන්වීම සඳහා බලපාන සාධක කවරේ ද? (ලකුණු 4)

(ii). සහතික මිල ප්‍රතිපත්තියක් නිසා සුභසාධන අහිමිවීමක් හටගන්නේ කෙසේදැයි රූපසටහන් අනුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii). ආර්ථික අතිරික්තයේ අඩුවීම හා අහිමිවන සුභසාධනය සමාන අර්ථ දෙන සංකල්පවේ ද පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iv). පහත දැක්වෙන්නේ තරඟකාරි වෙළඳපළක ඉල්ලුම් හා සැපයුම් තොරතුරුවලට අදාළ දත්ත කිහිපයකි

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 2 | 50 | 10 |
| 4 | 30 | 30 |

මෙම භාණ්ඩය සඳහා ඒකකයට රු.2.00 බැගින් වූ ඒකක බද්දක් නිෂ්පාදකයා මත පනවනු ලැබුහොත්

(අ).ගැනුම්කරු ගෙවන මිල කීයද ? (ලකුණු 3)

(ආ).රජයේ බදු ආදායම ගණනය කරන්න (ලකුණු 3)

4. (i). ' හීනවනඵලදා න්‍යාය' පැහැදිලි කරන්න (ලකුණු 2)

(ii). මුළු ඵලදා වක්‍රය මුළු ඵලදා වක්‍රය මඟින් ද, ආන්තික පිරිවැය වක්‍රය මුළු පිරිවැය වක්‍රය මඟින් ද ව්‍යුත්පන්න වේ. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න (ලකුණු 4)

(iii). නිදසුන් සහිතව ආරෝපිත පිරිවැය පැහැදිලි කරන්න. නිෂ්පාදන ආයතනයක ආරෝපිත පිරිවැය හා ආවස්ථික පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iv). පූර්ණ තරඟකාරි නිෂ්පාදන ආයතනයක් කෙටිකාලයේ දී මුහුණ දෙන පිරිවැය හා අයභාර ව්‍යුහය පහත සඳහන් ප්‍රස්ථාරයෙන් නිරූපණය කරයි.




(අ). සමතුලිතයේදී ආයතනය උපයන සාමාන්‍ය මුළු පිරිවැය කොපමණ ද? (ලකුණු 1)

(ආ). ආයතනය උපයන ආර්ථික ලාභය හෝ අලාභය කොපමණ ද? (ලකුණු 1)

(ඉ). මෙම ආයතනය නිපදවන භාණ්ඩයන් වෙළඳපොළට සැපයීම සඳහා නිෂ්පාදකයා බලාපොරොත්තු වන අවම ආදායම කොපමණ ද? (ලකුණු 2)

(ඊ). මෙම ආයතනය වසා දැමීමට තිරණය වුවහොත් ආයතනයට දැරීමට සිදු වන පිරිවැය කොපමණ ද? එය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v). ඒකාධිකාරි තරඟ වෙළඳපොළ යනු පූර්ණ තරඟකාරි හා ඒකාධිකාරි වෙළඳපොළක අතරමැදි නියායකි. පැහැදිලි කරන්න. (ලකුණු 4)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

5. (i). පහත සඳහන් කරුණු රටක දළ දේශීය නිෂ්පාදිතයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
   (අ). ගෘහස්ථ ඇඳුම් මසන්නකුගේ ආදායම
   (ආ). රජය විසින් ලබා ගත් දේශීය හා විදේශීය ණය වෙනුවෙන් කරන පොලී ගෙවීම
   (ඉ). රජයේ පාසල් නඩත්තු කිරීම සඳහා දරන වියදම්
   (ඊ). රජයේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි නොවුණු වෛද්‍යවරයකු විසින් ලබා ගත් සේවය

(ලකුණු 1×2 = 4)

(ii). එක්තරා ආර්ථිකයක ජාතික ගිනුම් සම්බන්ධ දත්ත පෙළක් පහත දැක්වේ.(සියලු සංඛ්‍යා රු.බි. වලිනි)

| අයිතම | වටිනාකම (රු.බි) |
|---|---|
| කුටුම්බවල අවසන් පරිභෝජනය | 15 000 |
| ලාභ අපේක්ෂාවෙන් තොර කුටුම්බ සඳහා සේවා සපයන ආයතනවල වියදම | 10 000 |
| රජයේ පුද්ගල පරිභෝජන වියදම | 10 000 |
| රජයේ සාමූහික පරිභෝජන වියදම | 5 000 |
| දළ ප්‍රාග්ධන සම්පාදනය | 20 000 |
| ශුද්ධ අපනයන | - 2 000 |
| ශුද්ධ විදේශීය සාධක ආදායම | - 1 000 |
| ශුද්ධ විදේශීය ද්විතීය ආදායම් | 300 |

පහත දෑ ගණනය කරන්න.
   (අ). දළ ජාතික ආදායම
   (ආ). කුටුම්භවල සත්‍ය සුනිච්චිත පරිභෝජන වියදම (ලකුණු 2 × 2 = 4)

(iii). ජාතික ගිණුම් ගණනය කිරීමට අදාල නිෂ්පාදනය හා ආනයනය මත බදු (Tax on production and imports) යන සංකල්පය පැහැදිලි කරන්න (ලකුණු 3)

(iv). සමතුලිත ආදායම් මට්ටම යන්නෙන් කුමක් අදහස් වේ ද? විවෘත ආර්ථිකයක ජාතික ආදායම් මට්ටමෙ සමතුලිතය සඳහා අවශ්‍ය කරන කොන්දේසි කවරේද? සංකේත යොදා ගනිමින් පැහැදිලි කරන්න (ලකුණු 3)

(v). කල්පිත ආර්ථිකයක් සඳහා අදාල සාර්ව ආර්ථික දත්ත පහතින් දැක්වේ. (සංඛ්‍යා රු.බි. වලිනි)

පරිභෝජන ශ්‍රිතය (C) = 50 + 0.8 Yd
ආයෝජනය (I) = 100
රජයේ වියදම් (G) = 200
ශුද්ධ අපනයන (NX) = - 90
ස්වාධීන බදු (T) = 75

   (අ). මෙම ආර්ථිකයේ ස්වාධීන වියදම්වල එකතුව කොපමණද?
   (ආ). මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම කොපමණද?
   (ඉ). පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම රු.බි. 1 500 ක් වේ නම් ඒ සඳහා රජයේ වියදම් කොපමණ ප්‍රමාණයකින් වැඩි කළ යුතු ද? (ලකුණු 2 × 3 = 6)

## 'ආ' කොටස

( මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

6. i. මුදල් සඳහා පවතින ද්‍රවශීලතාවරණය කුමක්දැයි පැහැදිලි කරමින් එය ඇති වීම කෙරෙහි බලපාන හේතු සඳහන් කරන්න. (ලකුණු 4)

(ii). මුදලේ අගය සහ මිල මටටමට සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 2)

(iii) බැංකු පද්ධතිය තුළ එක්තරා වාණිජ බැංකුවක් සතු ව රු. මිලියන 20 ක සංචිත ද රු. මිලියන 100 ක තැන්පතු ද ඇති අතර, අවශ්‍ය කරන සංචිත අනුපාතය 20% ක් බවද සලකන්න.මහජනයා විසින් මෙම බැංකුවෙහි රු.මිලියන 5 ක ව්‍යවහාර මුදල් තැන්පත් කරනු ලැබුවහොත්, බැංකුවෙහි අධි සංචිත කොපමණ වේ ද? (ලකුණු 4)

(iv). (අ) "බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිය" හඳුන්වන්න (ලකුණු 2)
   (ආ). ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ඇති වූ වෙනස්කම් මොනවද? (ලකුණු 4)

(v) ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත් වීමේ රාමුව ඇගයීම් ක්‍රියාවලියේ ජාතික වැදගත්වන සාධක මොනවද? (ලකුණු 4)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

7. (i). පහත එක් එක් වැඩසටහන් සහ ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් බිහි වන බාහිරතාවයේ ස්වභාවය කවරක්දැයි සඳහන් කරන්න.

a) වන වගාවකක් ඇති කිරීම තුළින් ජල මූලාශ්‍ර ඉහළ නැංවීම

b) දෙමුහුන් වාහන සඳහා බදු අඩු කරමින් එම වාහන පරිහරණය දිරිමත් කිරීම.

c) කෘෂි බෝග වගාව සඳහා කෘමිනාශක හඳුන්වා දීම

d) බෝවන රෝග සඳහා අදාළ වන පාලන එන්නත් රජය විසින් නොමිලේ ලබා දීම (ලකුණු 4)

(ii). රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මඟින් ආදායම් අසමානතාව අඩු කළ හැකි ආකාර මොනවද? (ලකුණු 4)

(iii). ශ්‍රී ලංකාවෙ 2024 වර්ෂයේ බදු ආදායම ඉහළ ගොස් ඇත. එසේ ඉහළ යාමට බලපාන හේතු මොනවාද? (ලකුණු 4)

(iv). රාජ්‍ය මූල්‍ය කළමණාකරන පණත හඳුන්වා, එය ඇති කිරීමේ වැදගත්කම මොනවද? (ලකුණු 6)

(v). බාහිරතා අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද? (ලකුණු 2)

8. (i). රටවල් අතර වෙළෙඳ රටා තීරණය කිරීමට හේතු විය හැකි ආර්ථික සාධක සඳහන් කරන්න. (ලකුණු 3)

(ii). වෙළෙඳාම හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රටවල් දෙකක් හෝ කිහිපයක් අතර වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ වැදගත්කම සඳහන් කරන්න. (ලකුණු 4)

(iii). 2024 වර්ෂයේ "ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ සේවා ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය" එසේ ඉහළ අගයක් ගැනීමට දායකත්වය සැපයූ සේවා අනුපිළිවෙල අනුව දක්වන්න. (ලකුණු 3)

(iv). ශ්‍රී ලංකාවේ විදේශ සෘජු ආයෝජන වර්ධනය කර ගැනීම සඳහා "තනි කවුළු ප්‍රවේශය" (Single Window System) යන්න හඳුන්වා, එහි අරමුණු හා එය ඇති කිරීම මඟින් ලබාගත හැකි වැදගත්කම මොනවාද? (ලකුණු 6)

(v). ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගණුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි ඔබ වාර්තා කරන්නේ කෙසේ ද?

(අ). ශ්‍රී ලංකාව ඉන්දුනීසියාවෙන් ඩොලර් මිලියනයක සිමෙන්ති ආනයනය කිරීම

(ආ). ශ්‍රී ලාංකික ආයෝජකයන් විසින් ඩොලර් ලක්ෂ 5ක විදේශවලින් ආදායමක් ඉපයීම

(ඉ). ලෝක බැංකුවෙන් ලබා ගත් ණය ඩොලර් මිලියන 200 ක ණය වාරිකයක් ආපසු ගෙවීම.

(ඊ). විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ඩොලර් 1000 ක් ලැබීම. (ලකුණු 4)

9. (i). ආර්ථික වර්ධනය, සංවර්ධනය හා මානව සංවර්ධනය හඳුන්වන්න (ලකුණු 3)

(ii). 2023/2024 වර්ෂවල ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය හා ඒකී අංශවල සේවා නියුක්තියේ සාපේක්ෂ දායකත්වය කවරේ ද? (ලකුණු 6)

(iii). මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන "සමාජ අධාර" කේන්ද්‍රගත කරගත් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් කවරේ ද? (ලකුණු 5)

(iv). ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් බාහිර වර්ධන උපාය මාර්ගයකට ( Outward Growth Strategy) මාරු වීමේ ඇති අවශ්‍යතාවයන් ඔබ හඳුනා ගන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 6)

10. (i). ශ්‍රී ලංකාව ඩිජිටල් ආර්ථිකයක් බවට පත් කිරීමේ ඇති වැදගත්කම කවරේ ද? (ලකුණු 5)

(ii). ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අමතරව ලෝක බැංකුව මඟින් ශ්‍රී ලංකාවේ ණය අර්බුදය විසඳාලීම සඳහා ලබා දුන් සහයෝගය ඇගයීමක් කරන්න. (ලකුණු 5)

(iii). ශ්‍රී ලංකාවේ අනාගතයේ දී ඇතිවිය හැකි ආර්ථික අර්බුධවලින් වලක්වා ගැනීම අරමුණු කර ගනිමින් පසු ගිය වසරේ සම්මත කරගත් ආර්ථික පරිවර්තන පණතේ ප්‍රධාන අරමුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 5)

(iv). රජය විසින් ක්‍රියාත්මක කරමින් පවතින 'අස්වැසුම" සමාජ ආධාර වැඩසටහන පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 5)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources